ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

ව්‍යවහාරිකවිද්‍යා පීඨය

පරිගණන අධ්‍යයනාංශය

# <u>තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව</u>

**හැඳින්වීම**

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය ව්‍යවහාරිකවිද්‍යා පීඨයේ, පරිගණන අධ්‍යයනාංශය විසින් පවත්වනු ලබන බාහිර පාඨමාලාවකි. උක්ත පාඨමාලාව ප්‍රධාන වශයෙන් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විධිමත් අධ්‍යාපනයක් බලාපොරොත්තු වන රජයේ හා පෞද්ගලික අංශයේ සේවයේ නියුතු වූවන් සහ රැකියා අපේක්ෂකයින් ඉලක්ක කොට පැවැත්වෙන්නකි. මෙම පාඨමාලාවේ ප්‍රධාන අරමුණ වන්නේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ප්‍රවීණත්වයක් ලබාගැනීම සඳහා අත්‍යවශ්‍ය වන සවිමත් පදනමක් සැපයීමයි. තවද, පරිගණන අධ්‍යයනාංශය මගින් පවත්වන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා පදනම් පාඨමාලාව ලෙස ද මෙම පාඨමාලාව සැලකෙනු ඇත.

ප්‍රදේශයේ ඉහළ ම සුදුසුකම් සහිත ආචාර්ය මණ්ඩලය විසින් පවත්වනු ලබන මෙම පාඨමාලාවට බඳවා ගැනෙන්නේ සීමිත සිසුන් පිරිසක් පමණි. මෙම සහතික පත්‍ර පාඨමාලාව NVQ 3 වන මට්ටමට සමාන වේ.

**ඇතුළත් වීමේ සුදුසුකම්**

- **අවම සුදුසුකම්:**

  - ❖ සිංහල/දෙමළ සමග ගණිතය, තොරතුරු සන්නිවේදන තාක්ෂණය, ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය, සහ ඉංජිනේරු තාක්ෂණය යන විෂය අතරින් එකක් සහිත ව අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂය 6 ක් සමත්වීම

    **හෝ**
  - ❖ සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගයෙන් සමත්වීම

    **හෝ**
  - ❖ පිළිගත හැකි වෙනත් සමාන සුදුසුකම්.

**අපේක්ෂකයන් තෝරා ගැනීම:** තෝරා ගැනීමේ පරීක්ෂණයෙන් සහ සම්මුඛ පරීක්ෂණයෙන්

**විෂය මාලාව:**

**CICT 01 - Fundamentals of ICT**
**CICT 02 - System Software**
**CICT 03 - Application Software**
**CICT 04 - Programming Techniques**
**CICT 05 - Computer Networks**
**CICT 06 - Introduction to HTML and CSS**
**CICT 07 - Internet and e—mail**

**පාඨමාලා කාලය:**

සය මාසික සහතික පත්‍ර පාඨමාලාව අතරතුර සිසුන්ට පැය 120 කට නො අඩු ඉගෙනීම් කාලයක් හිමි වන අතර, එය මිහින්තලේ, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ, පරිගණක මධ්‍යස්ථානයේ දී ඉරිදා දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පැවැත්වේ.

**මාධ්‍යය:**

සිංහල

**සම්පූර්ණ පාඨමාලා ගාස්තුව**

රු. 25,000/= **(ලියාපදිංචි වීමේ ගාස්තු: රු. 300/=, පාඨමාලා ගාස්තු: රු. 23,700/=, විභාග ගාස්තු: රු. 1,000/=)**

**අයදුම්පත් ගාස්තුව**

රු. 300/= **(මහජන බැංකුවේ, අනුරාධපුර ප්‍රධාන ශාඛාවේ ගිණුම් අංක 008-1-001-3-1724472 දරණ ගිණුමට තැම්පත්කළ යුතු ය.)**

**සම්පූර්ණ පාඨමාලා ගාස්තුව පහත දැක්වෙන පරිදි වාරික වශයෙන් ද ගෙවිය හැක:**

| පළමු වාරිකය (ලියාපදිංචි වීමේ දී) | දෙවැනි වාරිකය (මාස 03ක් ඇතුළත) |
|---|---|
| රු. 15,000/= | රු. 10,000/= |

**ඇගයීම:**

- සෑම ශිෂ්‍යයෙකු ම විවිධ ඇගයීම් ක්‍රම මගින් අඛණ්ඩ ව අගයනු ඇත. මෙ මගින් සිසුන්ට පහසුවෙන් සමත් වීමේ හැකියාවක් ලැබේ.
- පාඨමාලාවේ අවසන් පරීක්ෂණය ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ, ව්‍යවහාරිකවිද්‍යා පීඨයේ, පරිගණන අධයයනාංශය විසින් පවත්වනු ඇත.
- සහතික පත්‍ර පාඨමාලාවේ අවසන් පරීක්ෂණය අවම වශයෙන් පැය තුනක (03) ක ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වන අතර මෙම පරීක්ෂණයෙන් සමත් වන්නන්ට සහතික පත්‍රයක් පිරිනැමෙනු ඇත.

**ඇගයීමේ ක්‍රමවේදය:**

- අඛණ්ඩ ඇගයීම - 35%
- අවසාන පරීක්ෂණය - 60%
- පැමිණීම - 5%

**අයදුම් කිරීම:**

අයදුම්පත්, https://www.rjt.ac.lk/wp-content/uploads/2023/08/Application_CICT.pdf දිගුව මගින් බාගත කරගත හැක.
කරුණාකර අයදුම්පත්, **තම ලිපිනය ලියන ලද ලියුම් කවර දෙකක් සහ අයදුම්පත් ගාස්තුව තැම්පත්කළ ලදුපත සමග** පහත දැක්වෙන ලිපිනයට එවන්න:

**සහකාර ලේඛකාධිකාරී**
**දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය**
**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය**
**බුලංකුලම දිසාව මාවත,**
**II පියවර,**
**අනුරාධපුරය - 50000**

කරුණාකර ඔබේ අයදුම්පතට අදාළ සියලු ම සහතික පත්‍රවල **සහතික කරන ලද ඡායා පිටපත්** අමුණන්න.

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය: 30.09.2026**

**වැඩි විස්තර සඳහා අමතන්න:**

025-324 4229 (සහකාර ලේඛකාධිකාරී),
025- 226 6792 (පරිගණක මධ්‍යස්ථානය),
071-630 2000 (ජයන්ත)
විද්‍යුත් තැපැල: cict@rjt.ac.lk